# ඔබේ පියයුරු පරීක්ෂා සේවා කැඳවීම ගැන

BreastScreen Victoria

ඔබට වැඩිදුර පරීක්ෂා සඳහා පැමිණෙන ලෙස දන්වා ඇති නිසා, දැන් සිදුවන්නේ කුමක්ද යන්න ගැන තොරතුරු සමහරක් මෙම තොරතුරු පත්‍රිකාව මගින් සපයනු ලැබේ.

## මට ආපසු පැමිණෙන ලෙස දන්වා ඇත්තේ ඇයි?

ඔබට වැඩිදුර පරීක්ෂාවන් සඳහා ආපසු පැමිණෙන ලෙස දන්වා ඇත්තේ ඔබේ මැමෝග්‍රෑමයේ (පියයුරු පරීක්ෂාවේ) පෙදෙසක් වැඩිදුර විමර්ශනය කර බැලීමට අවශ්‍ය නිසාය. වැඩිදුර පරීක්ෂාවන් සඳහා ආපසු කැඳවන කාන්තාවන් බොහෝ දෙනෙකුට පියයුරු පිළිකා නැත.

## මෙම පරීක්ෂාවන් සඳහා කොපමණ මිලක් වැය වේද?

වැඩිදුර ඇගයීම සඳහා වන සෑම පරීක්ෂාවක් ම නොමිලේ සිදු කෙරේ.

## පැමිණීමට කලින් මට කතා කළ හැක්කේ කා සමගද?

වැඩිදුර විස්තර ලබා ගැනීමට ඔබ කැමති නම්, පරීක්ෂා සේවය අමතා විශේෂ පුහුණුව ලත් හෙද උපදේශිකාවක සමග ඔබට කතාබහ කළ හැකිය.

## ඇගයීම් සේවයේ දී සිදු වන්නේ කුමක්ද?

ඔබ පැමිණි විට හෙදි උපදේශිකාවක් ඔබ හමු වී පරීක්ෂණ අවස්ථාවේ දී සිදුවන දේ ගැන ඔබට පැහැදිලි කර දීම සිදු වේ. අවශ්‍ය පරීක්ෂාවන් සිදු කිරීම සඳහා ඔබේ කැමැත්ත පළ කරන ආකෘති පත්‍රය කියවා අත්සන් කරන ලෙස ඔබට දන්වනු ඇත. අනුමැතිය ලබා දෙන ආකෘති පත්‍රය ගැන ඔබට ගැටලු ඇත්නම් හෙද උපදේශිකාව මගින් ඒවාට පිළිතුරු සපයනු ලබනු ඇත, ඔබේ පරීක්ෂාව පැවැත්වෙන සම්පූර්ණ කාලය පුරා ම ඇගයීම් කණ්ඩායම ඔබට සහාය වනු ඇත. විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් විසින් විමර්ශනය කළ යුතු පෙදෙස ගැන ඇගයීමක් සිදු කරනු ඇත.

## පරීක්ෂාව සඳහා කොපමණ කාලයක් ගත වේද?

ඇගයීම් සේවාව (Assessment Service) තුළ ඔබේ හමුවීම සඳහා දින බාගයක් පමණ වෙන් කරන්න. ඔබ වැඩ කරන ස්ථානයට දීමට පැමිණි බවට සහතිකයක් අපට ලබා දිය හැකිය.

## මට අවශ්‍ය වන්නේ කුමන පරීක්ෂාවන්ද?

ඔබට මෙම පරීක්ෂා අතරින් සමහරක් හෝ සියල්ල ම සිදු කිරීම අවශ්‍ය විය හැකිය:

- **අමතර මැමෝග්‍රෑම්** – පියයුරුවල වෙනස්වීම් පෙන්නුම් කළ පෙදෙස් ගැන වෛද්‍යවරුන්ට වඩාත් සමීපව බැලිය හැකි සේ අමතර මැමොග්‍රෑම් ලබා ගැනීම සිදු වේ. මේ සම්බන්ධයෙන් ඇති අවදානම වන්නේ විකිරණවලට නිරාවරණය වීම වුවත්, මැමෝග්‍රෑම් පරීක්ෂාවේ දී ඉතා අඩු මාත්‍රාවක විකිරණ යොදා ගන්නා බැවින්, මෙමගින් ලැබෙන ඵලය එහි ඇති අවදානම ඉක්මවයි. සමහර අවස්ථාවල දී අමතර මැමෝග්‍රෑම් ලබා ගැනීම නිසා අපහසුතා ඇතිවීමට ඉඩ තිබේ. එයින් ඔබට අධික අපහසුතාවක් දැනේ නම් එය නවත්වන ලෙස පවසා සිටීමෙන්, වහාම පරීක්ෂාව නැවැත්විය හැකිය.
- **පියයුරු අතිධ්වනිය (අල්ට්‍රාසවුන්ඩ්)** – පියයුරු පටකවල අමතර විස්තර පෙන්නුම් කිරීම සඳහා ධ්වනි තරංග උපයෝගී කර ගනු ලැබේ. මෙහි දී පියයුරුවල ජෙල් වර්ගයක් ආලේප කර සෙවුම් උපකරණයක් සම මත තැබීම සිදු වේ. අතිධ්වනියේ අවදානමක් නැති අතර එය වේදනාවක් හෝ අපහසුතා ඇති නොකරයි.
- **පියයුරු පරීක්ෂාකර බැලීම** – ඇසට හෝ ස්පර්ශයට කිසියම් වෙනසක් දැනේ දැයි වෛද්‍යවරිය විසින් පරීක්ෂා කර බලනු ඇත.
- **පියයුරු ජීවපටක ඉඳිකටු පරීක්ෂාව** – වෛද්‍යවරිය විසින් ඉඳිකටුවක් භාවිත කර, පියයුරුවල පරීක්ෂා කර බැලිය යුතු පෙදෙසෙන් කුඩා පටක හෝ සෛල සාම්පලයක් ලබා ගනු ඇත. ඔබට මේ පරීක්ෂාව අවශ්‍ය නම් ඒ පිළිබඳ වැඩිදුර විස්තර සපයනු ඇත.

## මට ඇති විකල්ප මොනවාද?

ඔබේ කැමත්ත ඉල්ලා අස්කරගෙන, වහා ම පරීක්ෂාවන් නවත්වන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය.

## මට ප්‍රතිඵල ලැබෙන්නේ කවදාද?

බොහෝ කාන්තාවන්ට එම දිනයේ දීම ප්‍රතිඵල සපයනු ලැබේ. එහෙත් ජීවපටක පරීක්ෂාවේ ප්‍රතිඵල නිකුත් කිරීමට සතියක් දක්වා කල් ගත වීමට ඉඩ ඇත. ඔබේ ප්‍රතිඵලවල පිටපත් ඔබේ වෛද්‍යවරයා වෙත යැවීම සිදු වේ.

## මීලඟට සිදු වන්නේ කුමක්ද?

පියයුරු පිළිකා පිළිබඳ කිසිම සළකුණක් පරීක්ෂාවේ දී හමු නොවූ බවට බොහෝ කාන්තාවන්ට පැවසෙන අතර ඔවුන්ට සාමාන්‍ය ආකාරයට වසර දෙකකට පසු පරීක්ෂාව සඳහා නැවත පැමිණෙන ලෙස ඇරයුම් කෙරෙනු ඇත.

## පියයුරු පිළිකාවක් ඇති බව සොයා ගතහොත් සිදු වන්නේ කුමක්ද?

කාන්තාවන් සුලු ගණනකට පියයුරු පිළිකා ඇති බවට රෝග විනිශ්චය කිරීම සිදු වේ. ඔබට මෙය සිදු වුවහොත්, වෛද්‍යවරිය හා හෙද උපදේශිකාව ඔබ හමු වී සාකච්ඡා කර මීලඟට සිදු වන්නේ කුමක් ද යන්න ඔබට පැහැදිලි කර දෙනු ඇත. ඔබව ආපසු ඔබේ වෛද්‍යවරයා වෙත යොමු කෙරෙනු ලබන අතර ඔබේ වෛද්‍යවරයා විසින් දිගින් දිගට ම කරගෙන යායුතු ප්‍රතිකාර සම්බන්ධයෙන් යොමුකිරීම් සිදු කරනු ඇත. පරීක්ෂාවන් හි දී සොයාගනු ලබන පියයුරු පිළිකා බොහොමයක් මුල් අවධියේ දී අනාවරණය වන පිළිකා වේ. පියයුරු පිළිකා වේලාසනින් සොයා ගත් විට ඒවා වඩා කුඩා පිළිකා වීමට ඉඩ ඇති අතර ඒවාට සාර්ථක ලෙස ප්‍රතිකාර කිරීමට බොහෝ විට හැකියාව ඇත.

වැඩිදුර තොරතුරු සඳහා: **breastscreen.org.au**


© 2020 BreastScreen Victoria සියලු හිමිකම් ඇවිරිණි